# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1554 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 10/12/2023<br>පැය 2000 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

### 01. මාරක රිය අනතුරක් - මිරිහාන පොලිස් වසම.

2023.12.10 වන දින උදෑසන කාලයේ මිරිහාන පොලිස් වසමේ පරණ කොට්ටාව මාර්ගයේ විවේකාරාම විහාරස්ථානයට හැරෙන හන්දියේදී ඇඹුල්දෙණිය දෙස සිට පැඟිරිවත්ත දෙසට ධාවනය කල ලොරි රථයක පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කළුබෝවිල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ මිරිහාන, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මිරිහාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - හික්කඩුව පොලිස් වසම.

2023.12.10 වන අද දින අළුයම් කාලයේ හික්කඩුව පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ වැවල හන්දියේදී කොළඹ දෙස සිට ගාල්ල දෙසට අධික වේගයෙන් ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන නවතා තිබූ යතුරුපැදියක හා තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වූ කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් මිතුරන් දෙදෙනෙකු සමඟ යතුරු පැදි දෙකකින් කොළඹ දෙස සිට ගාල්ල දෙසට පැමිණ හික්කඩුව වැවල හන්දිය අසල නවතාගෙන සිට ඇත. මරණකරු පැමිණි යතුරු පැදිය ආපසු කොළඹ දෙසට හරවා මඳ දුරක් කොළඹ දෙසට ගොස් නැවත ගාල්ල දෙසට හරවා වේගයෙන් යතුරු පැදිය පදවාගෙන ඒමේ දී මෙලෙස අනතුරට පත්ව ඇත.

මෙම අනතුර රියදුරුගේ නොසලකිලිමත්කම හා අපරික්ෂාකාරි රිය පැදවීම මත සිදුවී ඇති බවට විමර්ශන වලදි අනාවරණය වී ඇත. අනතුර සම්බන්ධයෙන් හික්කඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**